# උසස් පෙළ - ව්‍යාපාර අධ්‍යයනය

# Advanced Level Business Studies




**Sudath Manjula Amarasena**
Senior Lecturer
Department Decision Sciences
Faculty of Management Studies & commerce
University of Sri Jayewardenepura

# 1.( i) දේශීය වෙළඳාම හා සම්බන්ධ ආයතන මොනවාදැයි දක්වන්න.




**ශ්‍රී ලංකා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය-** පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සදහා නීතිමය ආරක්ෂාව හා දේශීය වෙළඳුන් අධීක්ෂණය කරයි.

**පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව-**
දේශීය වෙළඳුන්ට එල්ලවන චෝදනා හා ගැටළු නිරාකරණය කිරීමට මැදිහත් වේ.

**ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය-** දේශීය වෙළඳුන්ගේ නිෂ්පාදිතවල ගුණාත්මකභාවය කෙරෙහි ප්‍රමිති සම්පාදනය, ක්‍රියාත්මක කිරීම හා පාලනය

# (ii) විද්‍යුත් සිල්ලර වෙළදාම් කුමක්දැයි පැහැදිලි කරන්න.

අන්තර්ජාලය හරහා පාරිභෝගිකයින් වෙත සෘජුවම නිෂ්පාදිත විකිනීමට ඉදිරිපත් කිරීම වේ වර්තමානයේ අන්තර්ජාල මිලදී ගැනීම් වලට වැඩිපුර නැඹුරු වී ඇත්තේ ඉතා හොද අධ්‍යාපනයක් ලත් අය මුල්‍යමය ලෙස ශක්තිමත් තරුණ පිරිස් කාර්යාල, පාසල් යනාදියේ සේවය කරන්නන් ඉහත සදහන් කල පිරිස් අන්තර්ජාල මිලදී ගැනීම සදහා යොමුවන්නේය.



1. පිරිවැය අඩු නිසා
2. තෝරා ගැනීම් වැඩි නිසා
3. පහසු නිසා
4. තමාට ගැලපෙන දේ මිලදී ගත හැකි නිසා
5. තොරතුරු බහුල නිසා
6. පාලනය කල හැකි නිසා

## (iii) (අ) ශ්‍රී ලංකාවේ මාර්ග තදබදයට හේතු මොනවාදැයි දක්වන්න.



- මාර්ග දෙපස සිදුකර ඇති අනවසර ඉදිකිරීම් නිසා ඇතිවන බාධා
- බොහෝ මාර්ග අලුත්වැඩියා නොකිරීම
- බොහෝ මාර්ග පටු වීම
- ධාවනය සදහා එක්වන මෝටර් රථ ගණන ඉහල යාම නිසා ඊට සරිලන ආකාරයට මාර්ග පුළුල් නොවීම
- දුර්වල රථවාහන සැලැස්ම
- පදික වෙළදාම නිසා පදිකයන් මාර්ගයේ ගමන් කිරීම

# (අ) දුම්රිය සේවයේ කාර්යක්ෂමතාව හීනවීමට හේතු

- අවම ගාස්තු ක්‍රමයක් ක්‍රියාත්මක වීම
- නිතර පවත්නා සේවක අරගල
- නඩත්තුව දුර්වල වීම
- අරමුදල් ඌනතාව
- සංවිධාන ව්‍යුහය දුර්වල වීම
- අතිරික්ත සේවක සංඛ්‍යාවක් සිටීම




**Iv (අ) හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන්ට ද්විත්ව චරිතයක් ඇතැයි යනුවෙන් අදහස් වන්නේ කුමක්ද ?**




හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන් අතර අන්‍යෝන්‍ය වශයෙන් නියෝජක නියෝජීක නියෝජීත සම්බන්ධතාවයක් ජනිත වන නිසා විටෙක හවුල්කරුවෙකු අනෙකුත් හවුල්කරුවන්ගේ නියෝජිතයෙක් ලෙස සැලකෙන අතරම තවත් විටෙක ඔහු ප්‍රධානියෙකු ලෙස සලකනු ලබයි.

## (ආ) හවුල් ව්‍යාපාරය සඳහා අදාල වන ප්‍රධාන නීති රීති හතරක් නම් කොට ඒවා බලපාන ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

1. 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත ( 24 වන වගන්තිය ප්‍රධාන වශයෙන් )
2. 1840 අංක 07 දරන වංචා වැලැක්වීමේ ආඥා පනතේ 18 වැනි වගන්තිය
3. 1918 අංක 06 දරන ව්‍යාපාර නාම ආඥා පනත
4. 2007 අංක 07 දරන සමාගම් පනත




Japura Media

## (V )ව්‍යාපාරයක් යෝග්‍ය සන්නිවේදන මාධ්‍යක් තෝරා ගැනීමේදී අවධානය යොමු කල යුතු සාධක

Japura Media



- පණිවුඩයේ ස්වභාවය
- පිරිවැය
- වේගය
- නිත්‍යානුකූල බව
- සුලබත්වය
- දුර ප්‍රමාණය
- රහස්‍ය බව හා ආරක්ෂාව

**2.(i) (අ) ශ්‍රී ලංකාවෙහි ගණුදෙනු කල හැකි ලියවිලි ලෙස සැලකෙන චෙක්පත්,විනිමය බිල්පත් , පොරොන්දු නෝට්ටු යන ලියවිලි අතරින් චෙක්පත් යනු කුමක්දැයි විස්තර කොට එකී ලියවිලි වලට අදාල වන නීතිමය ව්‍යවස්ථා දක්වන්න.**

1927 අංක 25 දරන **විනිමය බිල්පත්** ආඥා පනත


www.shutterstock.com · 311226329

චෙක්පතක් යනු නිශ්චිත පුද්ගලයෙකුට හෝ ඔහුගේ ඇණවුමට හෝ රැගෙන එන්නාට යම් නිශ්චිත මුදල් ප්‍රමාණයක් යම් නිශ්චිත දිනයකදී ගෙවිය යුතු බවට එක් පුද්ගලයෙකු විසින් ලියා අත්සන් කොට වාණිජ බැංකුවක් වෙත කරනු ලබන්නා වූ ලිඛිත නියෝගයකි.

**(ආ) චෙක්පත් රේඛන වර්ග 4 ක් නම් කොට ඒවායින් ජනිත වන නෛතික ප්‍රතිඵල මොනවාදැයි දක්වන්න.**

1. සාමාන්‍ය රේඛනය
2. විශේෂ රේඛනය
3. ආදායකයාගේ ගිණුමට පමණයි යන රේඛනය
4. ගණුදෙනු කල නොහැකිය යන රේඛනය



**(ii)(අ) රක්ෂණයේදී යෙදෙන ප්‍රධාන මූලධර්මයන් වන උපරිම විශ්වාසය කුමක්දැයි විස්තර කොට උපරිම විශ්වාසය කඩ කිරීම සම්බන්ධයෙන් ගත හැකි ප්‍රතිකර්ම දෙකක් දක්වන්න.**

1. ගිවිසුම අවසන් කල හැකි වීම
2. ගිවිසුම යටතේ ඉටු කල යුතු වගකීම් ඉටු කිරීම ප්‍රතික්ෂේප කල හැකි වීම
3. අලාභ අයකරවා ගත හැකි වීම



# (ආ)ජීවිතයක් ප්‍රාරක්ෂණය කිරීම යනුවෙන් කුමක් අදහස් වේද?

ජීවිතයක් පිළිබද අවදානම විවිධ කාර්ණා වලට අවධානය යොමු කරමින් රක්ෂකයා විසින් බාර ගන්නාද නැද්ද යන්න තීරණය කිරීමයි.



**(iii)(අ) වර්තමානයේ වානිජ ලෝකය තුල ප්‍රබලව සංනිවේදන තාක්ෂණයේ දියුණුවේ බලපෑම දක්නට පුළුවන. විද්‍යුත් වානිජ්‍ය ( E – Commerce) හා මොබයිල් (ජංගම) වානිජ්‍ය ( M- Commerce) අතර වෙනස කුමක්දැයි පැහැදිලි කරන්න.**

නිශ්චිත ස්ථානයක ඇති අන්තර්ජාලයට සම්බන්ධ පරිගණකයක් භාවිතයෙන් ව්‍යාපර කටයුතු ක්‍රියාත්මක කිරීම විද්‍යුත් වාණිජ්‍ය තුල සිදු කෙරෙන අතර ඕනෑම ස්ථානයක සිට හෝ ගමන් කරමින් සිටින අතර තුරදී හෝ අන්තර්ජාලයට සම්බන්ධ ජංගම දුරකථනයක් මාර්ගයෙන් කෙරෙන ගණුදෙනු මොබයිල් **වානිජ්‍ය** ලෙස සලකයි.




www.shutterstock.com · 306970442

## (ආ) විද්‍යුත් බැංකුකරණය සඳහා භාවිත වන නවීනතම උපකරණයක් වන ටී - බැංකුකරණය ( T – Banking ) යනු කුමක්ද




අන්තර්ජාලයට සම්බන්ධිත රූපවාහිනී යන්ත්‍රය භාවිතයෙන් බැංකු කටයුතු වල නිරත විම.

R-G TVBanking

**(iv) තොග පාලනය  සඳහා භාවිත වන ප්‍රධාන ශිල්ප ක්‍රම හතරක්  නම් කොට  ඒවායින් දෙකක් පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.**

1. ආර්ථික ඇණවුම් ප්‍රමාණ ආකෘතිය ( EOQ)
2. ද්විත්ව භාජන ක්‍රමය
3. ABC  විශ්ලේෂණය
4. ද්‍රව්‍ය අවශ්‍යතා  සැලැස්ම ( MRP)
5. JIT – JUST IN TIME
6. සැපයුම් දාම කළමනාකරණය




www.shutterstock.com · 220042468

**(v)(ඇ) භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේදී භාවිත කෙරෙන ක්‍රියාවලි ප්‍රවාහ ව්‍යුහ වර්ග මොනවාදැයි නම් කොට ප්‍රායෝගික උදාහරණ සහිතව ඒවා කෙටියෙන් විස්තර කරන්න.**




1. කාර්යය නිෂ්පාදනය - Job shop
2. කාන්ඩ නිෂ්පාදනය - Batch Shop
3. අඛණ්ඩ ප්‍රවාහ නිෂ්පාදනය - continuous Process
4. එකලස් පේළි ක්‍රමය - Assembly line

**(ආ) ආයතනයකට යෝග්‍ය පිරියත සැලසුම් කිරීමක් වැදගත් වන ආකාරය විස්තර කරන්න.**




1. අක්‍රිය කාලය අවම වීම
2. අතිරේඛ පිරිවැය අවම විම
3. සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගත හැකි වීම
4. අනවශ්‍ය චලන අවමවීම
5. ඵලදායකත්වය ඉහළ යාම
6. නිෂ්පාදිත වල ගුණත්වය ඉහළ යාම

**3.(i) (අ) පූර්ණ ගුණත්ව කළමනාකරණය යනු කුමක්දැයි හඳුන්වා එය ක්‍රියාත්මක කිරීම සඳහා වූ මූලධර්ම මොනවාදැයි පෙන්වන්න.**

සැපයුම්කරුවන්ගෙන් අමුද්‍රව්‍ය ලබා ගැනීමේ අවස්ථාවේ සිට භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කොට තොග හා සිල්ලර වෙළෙඳුන් මාර්ගයෙන් බෙදා හැර පාරිභෝගිකයාට අලෙවි කිරීම හා අලෙවියෙන් පසු අවස්ථාව දක්වාම ආයතනයක් ඉටු කල යුතු සියළුම කාර්යයන් තුළින් ඉහළ පාරිභොගික තෘප්තියක් ඇතිවන ආකාරයටත් ,අඛණ්ඩව ගුණත්වය වැඩි දියුණු කෙරෙන ආකාරයට සියළුම පාර්ශවයන්ගේ දායකත්වය ලැබෙන පරිදි කටයුතු කිරීම පූර්ණ ගුණත්ව කළමනාකරණයවේ.




## (ii) පූර්ණ ගුණත්ව කළමනාකරණ මූලධර්ම

1.පාරිභෝගික නැඹුරුව
2. නායකත්වය
3. සේවක වගකීමක් බව
4. උපාය මාර්ගික සැලසුම්
5. සංඛ්‍යාන විද්‍යාත්මක ශිල්ප ක්‍රම
6. පුහුණුව හා සංවර්ධනය
7. අධ්‍යාපනය

Japura Media



**iii (ආ) පරිගණක ආධාරක නිර්මාණ ( CAD) සහ පරිගණක ආධාරක නිෂ්පාදනය (CAM) ක්‍රමය අතර වෙනස පැහැදිලි කරන්න.**




(CAD) පරිගණක තාක්ෂණය භාවිතයෙන් නිෂ්පාදිතය නිර්මාණය කිරීම


(CAM) පරිගණක තාක්ෂණය භාවිතයෙන් නිෂ්පාදිතය නිෂ්පාදනය කිරීම

iv භාණ්ඩ නිෂ්පාදන ආයතනයක මාසයක කාලපරිච්ඡේදයක් තුල නිපදනවන ලද ප්‍රධාන හා අතුරු නිෂ්පාදන වලට අදාල නිමැවුම් සහ යෙදවුම් පිළිබද තොරතුරු පහත දක්වා ඇත.

ප්‍රධාන නිෂ්පාදිතයේ විකුණුම් වටිනාකම රු. 120, අමුද්‍රව්‍ය රු. 40,ශ්‍රමය රු. 35,අතුරු නිෂ්පාදන රු. 80, ප්‍රාග්ධනය 20 සහ අනෙකුත් යෙදවුම් රු. 5 ක් නම්,

(අ) මුළු ඵලදායකත්වය සහ අමුද්‍රව්‍ය වල ආංශික ඵලදායකත්වය කොපමණද ?

Japura Media




මුළු ඵලදායකත්වය = 200/100 = 2

අමුද්‍රව්‍ය වල ආංශික ඵලදායකත්වය = 200/40 = 5

# (ආ) සමස්ථයක් වශයෙන් ආයතනයක ඵලදායකත්වය වැඩි දියුණු කිරීම කෙරෙහි බල පෑ හැකි සාධක මොනවාද ?

1. කළමනාකරණය - Management
2. ක්‍රම - Method
3. තාක්ෂණය -Technology
4. ගුණත්වය -Quality
5. ප්‍රාග්ධනය - Capital

